IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2014/2015

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2017 ජුනි)

## BLE 105 - නෛතික පරිසරය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1 ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

2 මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නවයකින් (09) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

3 කාලය පැය තුනයි. (03)

4 පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

5 අපහැදිලි අත්අකුරු වලට ලකුණු අඩුකෙරේ.

6 ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. "ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය විවිධ නැඹුරු ගෙන සංවර්ධනය වූ ආකාරය විමසා බලන කල එය කැන්වසයක් මත නිර්මාණය වෙමින් පවතින චිත්‍රයක් ලෙස දැක්විය හැකිය".

ශ්‍රී ලංකාවේ වර්තමාන නෛතික පරිසරය තුළ අඩංගු විවිධ නීති ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශයේ සත්‍යතාව විමසන්න.

(ලකුණු 20)

02. ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ඇතැම් ඉංග්‍රීසි නීති මහා මාර්ග ඔස්සේ එළිපිටම ඇතුළු වූ අතර අනෙක් ඒවා හරස් පාරවල් සහ අතුරු මාවත් ඔස්සේ නිසොල්මනේ අවහිරයකින් තොරව ලිස්සා ආවේය.

උක්ත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 20)

03. i) අපගේ නීති පද්ධතිය හැදෑරීමේදී "රෝම ලන්දේසි නීතිය" යනුවෙන් කුමක් අදහස් වේද?

ii) ශ්‍රී ලංකාවේ නීති ක්ෂේත්‍රයට එම නීති ක්‍රමය වැදගත් වන්නේ මන්දැයි පෙන්වා දෙන්න.

iii) වර්තමාන ශ්‍රී ලාංකික නීති ක්ෂේත්‍රය තුළ රෝම ලන්දේසි නීති ක්‍රමයේ අනාගතය කෙබඳු වේ දැයි සළකා බලන්න.

(ලකුණු 20)

04. යාපනයේ උපත ලද චන්ද්‍රන් 2000 වසරේදී කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ප්‍රවේශය ලැබූ බැවින් මරදාන ප්‍රදේශයේ නිවසක කාමරයක් කුලියට ගෙන එහි පදිංචි වූ නමුත් නිවාඩු ලද සෑම අවස්ථාවකදීම ඔහු තම දෙමාපියන්ගේ සුවදුක් විමසීම සඳහා යාපනයට ගියේය. ත්‍රිකුණාමලයේ ද්‍රවිඩ තරුණියක වූ රාධා විශ්වවිද්‍යාලයේදී චන්ද්‍රන්ට මුණ ගැසුනු අතර 2008 දී ඔහු යාපනයේදී විවාහ විය. ත්‍රිකුණාමලයේ රාධා සතු නිවෙසක ඔවුහු පදිංචි වූ අතර චන්ද්‍රන් ත්‍රිකුණාමලය රජයේ රෝහලේ සේවයට බැඳුණේය. වසර කිපයක් ගත වූ පසුව රාධා සහ චන්ද්‍රන් අතර නිරන්තර අඩ දබර ඇතිවූ බැවින් 2014 වර්ෂය මැද භාගයේදී ඔහු රාධා ගෙන් දික්කසාද විය. අනතුරුව වසර 2017 වසර මුලදී ඔහු නිලන්ති නැමති ත්‍රිකුණාමලයේම පදිංචි සිංහල කාන්තාවක් සමඟ නැවත විවාහ විය. ඇය ඉඩම් කැබලි දෙකක හිමිකාරියක් වූ අතර ඉන් එක් ඉඩමක් ත්‍රිකුණාමලයේ පිහිටා තිබූ අතර අනෙක මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

තේසවලාමෙයි නීතිය රත්නම්ට, රාධාට මෙන්ම නිලන්ති සහ නිලන්තිගේ ඉඩම් වලට බලපාන්නේ දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. i) අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය සහ නඩු තීන්දු නීතිය අතර පවතින සම්බන්ධතාව කවරේදැයි පෙන්වා දෙන්න.

ii) නඩු තීන්දුවක හරය සහ ආගන්තුක ප්‍රකාශ අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යායට වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

iii) අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යායයේ සාර්ථක ක්‍රියාකාරිත්වය උදෙසා යම් නීති ක්‍රමයක පැවතිය යුතු අත්‍යාවශ්‍ය ලක්ෂණ කවරේද?

iv) මෙම න්‍යායයේ ක්‍රියාකාරිත්වය තුළ යම් නීති පද්ධතියකට හිමි වන වාසි සහ අවාසිදායක තත්වයන් වේ නම් ඒවා කවරේදැයි සැකෙවින් පෙන්වා දෙන්න.

(ලකුණු 20)

06. " මුස්ලිම්වරයෙක් යැයි හැඳින්විය හැකි ඕනෑම තැනැත්තෙක් ලංකාවේ කිනම් ස්ථානයක වාසය කළ ද ඔහු මුස්ලිම් නීතියට යටත්වේ. මේ අර්ථයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ පවතින එකම පිරිසිදු පුද්ගල නීතිය මුස්ලිම් නීතියයි"

උක්ත ප්‍රකාශය සමග ඔබට එකග විය හැකිද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 20)

07. කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන ශාස්ත්‍රීය සහ පර්යේෂණ සමුළුවකදී එහි ශිෂ්‍ය ඔබ හට පහත දැක්වෙන මාතෘකාව යටතේ ශාස්ත්‍රීය ලිපියක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙයි.

"දේශහුම් නීතියක සිට පුද්ගල හා ප්‍රාදේශීය නීතියක් දක්වා උඩරට නීතියේ ක්‍රමික විකාශය සහ එහි වර්තමාන අදාලත්වය: විනිශ්චිත නඩු තීරණ ඇසුරින් ප්‍රවේශයක්"

උක්ත මාතෘකාව යටතේ අදාළ ශාස්ත්‍රීය ලිපිය ලියා දක්වන්න.

(ලකුණු 20)

08. i) ශ්‍රී ලංකා ජනරජයේ උත්තරීතම, අවසනාත්මක, සහ ලේඛනෝපගත කිරීමේ ජ්‍යේෂ්ඨතම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය බවට කෙරෙන ප්‍රකාශය, යටින් ඉරි ඇඳි වචන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.

ii) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි කර දී තිබෙන අධිකරණ බලතල කවරේදැයි පෙන්වා දී ඒ අතුරින් එක් අධිකරණ බලයක් පිළිබඳව සටහනක් ලියන්න.

(ලකුණු 20)

09. i) ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික අධිකරණ ක්‍රියාපටිපාටියට පරිබාහිර ලෙස ක්‍රියාත්මක වන විකල්ප ආරාවුල් විසදුම් ක්‍රම කවරේද?

ii) එකී විකල්ප ආරාවුල් විසඳුම් ක්‍රම අතුරෙන් ඔබ කැමති ක්‍රමවේදයක් තෝරාගෙන, එකී ක්‍රමවේදය යටතේ ආරාවුල් නිරාකරණය කරනු ලබන ආකාරය සහ එහි පවතින ප්‍රායෝගික වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 20)

********